# ලංකා විදුලිබල මණ්ඩලය

# මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතිය

## ඇබෑර්තු

## විදුලි/ යාන්ත්‍රික අධිකාරී තනතුර

### කොන්ත්‍රාත් පදනම මත මාස 12 ක කාලයක් සඳහා

### (පුරප්පාඩු 4)

විදුලිබල හෝ කාර්මික ව්‍යාපෘති ක්ෂේත්‍රයට අදාළ පහත සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් ඉහත සඳහන් ව්‍යාපෘතියේ පවතින පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**රාජකාරි**

- මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතියේ ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා අදාළ තාක්ෂණික සේවාවන් ලබාදීම.

**සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා :**

- විදුලි හෝ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරාලිය යුතුය.

  ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) හෝ, ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඉංජිනේරුවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ

  තාක්ෂණවේදය පිළිබඳ ජාතික සහතිකපත්‍ර පාඨමාලාව (NCT) සහ අදාළ අංශයේ තනතුරක වසර 5 ක පළපුරුද්ද.

- බඳවාගන්නා දිනට වයස අවුරුදු 18 – 25 ත් අතර විය යුතුය.
- සුළං විදුලි බලාගාර ඉදිකිරීම්, නඩත්තු හෝ මෙහෙයුම් සම්බන්ධයෙන් වන දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.
- සිංහල හෝ දමිළ සහ ඉංග්‍රීසි භාෂා හැසිරවීමෙහි මනා දැනුමක් තිබිය යුතුය.
- මන්නාරම්, අනුරාධපුර, පුත්තලම් දිස්ත්‍රික්කවල හෝ උතුරු පළාතේ පදිංචි අයදුම්කරුවන් විශේෂයෙන් සලකා බැලෙනු ඇත.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** : 2020.09.17 දින.

**තෝරාගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් හෝ තරග විභාගයක් මගිනි.

**සේවයට අදාළ කොන්දේසි :**

- සේවය සඳහා බඳවාගැනීම මාස දෙළහක (12) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.
- සේවා ස්ථානය වනුයේ මන්නාරම දූපතේ පිහිටා ඇති මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතියයි.
- තෝරාගත් අයදුම්කරුවන් මන්නාරම පිහිටි ව්‍යාපෘති වැඩබිමේ සේවය කළයුතු අතර, අමතර පැය වැඩකිරීමට හැකිවිය යුතුය.

**වැටුප් හා වේතන :**

- රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව වනු ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

- රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව වනු ඇත.

ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් විසින් තම සම්පූර්ණ නම, පුද්ගලික සහ රාජකාරී ලිපිනය, තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තර හා දුරකථන අංක සහිත සම්පූර්ණ අයදුම්පත්‍රයක් (සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් පුරවන ලද) ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"විදුලි/යාන්ත්‍රික අධිකාරී තනතුර- MWPP ව්‍යාපෘතිය"** යනුවෙන් සටහන් කළ යුතුය.

රාජ්‍ය දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතනවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, යම් හෙයකින් තෝරාගතහොත් නිදහස් කළ හැකිද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා :**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ (MWPP ව්‍යාපෘතිය)**
**දු.අංක: 0112-889640**
**ෆැක්ස්: 0112-869631**

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**අංක 385, 4 වන මහල,**
**ලෑන්ඩ්මාර්ක් ගොඩනැගිල්ල,**
**කොළඹ 03.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD